# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
# පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරෙහි පුරප්පාඩු සඳහා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විශිෂ්ට චරිතයෙන් යුත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය - කළමනාකාර**
**තනතුරු නාමය - අභ්‍යන්තර විගණක (තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම් ( පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගිණුම්කරණය, කළමණාකරන හෝ වාණිජ්‍යය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබාතිබීම.

   සහ

   ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබාතිබීම.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වී තිබීම.

   සහ

   ඉහත සඳහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබාතිබීම.

<u>වැටුප් පරිමාණය</u>

**වැටුප් කාණ්ඩය** - MM 1 - 1 - 2016
**වැටුප් පරිමාණය - රු.** 53,175/- 10x1,375 - 15x1,910 - 95,575/- **කළමණාකාර සේවා චක්‍රලේඛ** 02/2016 **අනුව වැටුප් පරිවර්තනය කර ඇත.** 2017 **වර්ෂයේ මූලික වැටුප රු.** 36,654/-. **(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)**

වයසඃ අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

<u>පත්වීමේ ස්වභාවය</u>
ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

ඔබගේ තොරතුරු “A4” ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් අඩවියේ (www.nddcb.gov.lk) සඳහන් සුදුසුකම් අනුව ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමඟ **2017.03.27** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

අසම්පූර්ණ හා අයදුම්පත් බාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

**සභාපති**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**නො. 383, කෝට්ටේ පාර,**
**රාජගිරිය**